දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, **Fax:** 2784846

ඊමේල්/ஈ–மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ..............................

**අධ්‍යාපන අමාත්‍යාංශය**
**கல்வி அமைச்சு**

**Ministry of Education**
'ඉසුරුපාය' ශ්‍රී ජයවර්ධනපුරකෝට්ටේ බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுரகோட்டை பத்தரமுல்ல
"Isurupaya", SriJayawardhanapuraKotte
Battaramulla.

පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව

මගේ අංකය / எமது இல. / My No. } ED/01/12/02/06/01

දිනය / திகதி / Date } 2013.06. 28

චක්‍රලේඛ අංක : **27/2013**

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලුම රජයේ පාසල්වල ප්‍රධානීන් වෙත,

## අ.පො.ස. (උසස් පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම

උක්ත කරුණට අදාළව නිකුත් කරන ලද 2013.04.29 දිනැති 2013/4 දරන චක්‍රලේඛය සංශෝධනය කර 03 ඡේදයට පහත සඳහන් වගන්ති එකතු කරනු ලැබේ.

(ඊ) 2013/4 චක්‍රලේඛයේ 03 වගන්තියේ (අ), (ආ) සහ (ඇ) යන උපවගන්තිවලට අනුකූලව අතිදුෂ්කර, දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවලින් උසස් ලෙස සමත් වූ **සිසුන් ඇතුළත් කර ගැනීමෙන් පසු තවදුරටත් පුරප්පාඩු පවතින්නේ නම්,** විශිෂ්ට සාමාර්ථ 9ක් හෝ 8ක් (A-9 හා A-8)ලබා ගත් සිසුන් පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා ඇතුළත් කළ හැකිය.

(උ) තවද, අ.පො.ස (උසස් පෙළ) නව "තාක්ෂණවේදය" විෂයධාරාව සඳහා අදාළ පාසලේ පහසුකම් නොමැති අවස්ථාවල දී විශිෂ්ට සාමාර්ථ ලබා ඇති සිසුන්ට තම අභිමතය පරිදි **"තාක්ෂණවේදය" විෂයධාරාව ක්‍රියාත්මක වන කැමති පාසලකට එම පාසලේ පුරප්පාඩු පවතී නම් ඇතුළත්විය හැකිය.**

ඉහත සඳහන් කරන ලද අතිරේක විධිවිධානවලට අමතරව එම චක්‍රලේඛයේ සඳහන් සෙසු කරුණු සියල්ලම එලෙසම බල පැවැත්වේ.

එස්.එම්. ගෝඨාභය ජයරත්න
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය